# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,538 - 2008 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2008.02.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 186 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 187 |

*සැ. යු.*—ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 දෙසැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ධම්මාලංකාර සමාජසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 නොවැම්බර් 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2007.11.30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩිය නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදි කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 මාර්තු මස 18 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. ඇම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01. | බදුල්ල | මහියංගනය | මහියංගනය නගර කොට්ඨාසයේ උප්පන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |
| 02. | බදුල්ල | පස්සර | පස්සර නගර කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |
| 03. | බදුල්ල | හල්දුම්මුල්ල | කන්දපල්ල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ හපුතල කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

02-652

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩිය නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදි කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 මාර්තු මස 18 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. ඇම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01. | බදුල්ල | හල්දුම්මුල්ල | හල්දුම්මුල්ල කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| 02. | බදුල්ල | හාලිඇල | හාලිඇල කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| 03. | බදුල්ල | හාලිඇල | හාලිඇල ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |

02-653

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**තරුණ කටයුතු අමාත්‍යාංශය- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය**

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2007

තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සේවය කරනු ලබන ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සඳහා විභාගයක් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ. පහත සඳහන් නිවේදනයට අනුකූලව ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පරිපාටිය

(අ) මෙම විභාගය ප්‍රශ්න පත්‍ර හතරකින් යුක්ත වන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශ පහත සඳහන් වේ.
(ආ) එක් එක් විෂයය සඳහා මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 100 ක් වන අතර, එක් එක් විෂයයන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය 40 කි. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු 75 න් 30 ක් ද, වාචික පරීක්ෂණයේ ලකුණු 25 න් 10 ක් ද ලබා ගැනීම අවශ්‍ය වේ.)
(ඇ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
(ඈ) මෙම විභාගයට නියමිත විෂයයන් 04, එක් වතාවකදී හෝ කිහිප වතාවකදී හෝ පෙනී සිටිය හැකිය.

03. ප්‍රශ්න පත්‍ර සහ එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශ

*පළමුවන ප්‍රශ්න පත්‍රය* — (කාලය පැය 03 යි)

(I) මුදල් රෙගුලාසි (විෂය අංකය - 01)

(i) ඒකාබද්ධ අරමුදල
(ii) අයවැය වර්ගීකරණ ඒකක
(iii) පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම්
(iv) විරමොං ක්‍රියාපටිපාටිය
(v) ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ අධීක්ෂණය
(vi) ගණන්දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන්
(vii) ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම්
(viii) රාජ්‍ය ආදායම පිළිබඳ ගණන්දීමේ නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම්
(ix) භාණ්ඩාගාර අධීක්ෂණය හා පාලනය
(x) දෙපාර්තමේන්තුවක් වශයෙන් භාණ්ඩාගාරය සතු විධායක කාර්යයන්
(xi) අභ්‍යන්තර විගණනය
(xii) මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම ((අ) වියදම (ආ) ආදායම)
(xiii) විගණන විමසුම්
(xiv) ගෙවීම් කාර්ය පරිපාටිය
(xv) සමීක්ෂණ මණ්ඩල
(xvi) සැපයුම් හා සේවා ලබා ගැනීම පිළිබඳ කාර්ය පටිපාටිය
(xvii) අත්තිකාරම්

*දෙවන ප්‍රශ්න පත්‍රය* - (කාලය පැය 03යි)

II. ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම - (විෂය අංකය - 02)

ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩය හා II වන කාණ්ඩයෙහි කරුණු පිළිබඳව හා කාර්යාල ක්‍රම සහ ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම පිළිබඳ දැනුම විමසා බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

*තුන්වන ප්‍රශ්න පත්‍රය* — (කාලය පැය 03 යි)

III. නීතිය හා කළමනාකරණය - (විෂය අංකය - 03)

**නීතිය**

- නීතිය පිළිබඳ නිර්වචනය
- ශ්‍රී ලංකාවේ නීති පද්ධති
- ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
- සමාගම් ලියාපදිංචිය
- ව්‍යාපාර නාම ලියාපදිංචිය
- පේටන්ට් බලපත්‍ර
- ආදායම් බදු
- කම්කරු නීතිරීති
- පාරිසරික නීති

- පාරිභෝගික ආරක්ෂක පනත
- සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල
- පළාත් පාලන ආයතන මගින් පනවන නීතිරීති

**කළමනාකරණය**

- කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
- කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා
- සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
- සංවිධාන ව්‍යුහය
- කාර්ය සාධනය ඇගයීම
- අභිප්‍රේරණය
- නායකත්වය
- සන්නිවේදනය
- තීරණ ගැනීම
- ඵලදායිතාවය සහ ඵලදායිතා කව
- කළමනාකරණය ආචාර ධර්ම හා වගකීම
- බැංකු ක්‍රම
- රක්ෂණය

(ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව සාමාන්‍ය අවබෝධය මැන බැලීම සඳහා සකස් කරන ප්‍රශ්න පත්‍රයකි.)

*හතරවන ප්‍රශ්න පත්‍රය*

IV. ඉංග්‍රීසි (විෂය අංකය - 04)
(අ) ලිඛිත පරීක්ෂණය
(ආ) වාචික පරීක්ෂණය

04. ඉල්ලුම් කිරීමේ ක්‍රමය

(අ) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ සකස් කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (3) තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය 2 වන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2008.03.24 දිනට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට එවිය යුතුය :

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව)
පැලවත්ත,
බත්තරමුල්ල.

(ඇ) ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස "ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඈ) ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත් මගින් ඒ බව නිවේදනය කරනු ලැබේ. එවැනි නිවේදනයක් පිළිබඳව විමසිල්ලෙන් සිටීම වැදගත් වේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත්ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
පැලවත්ත,
බත්තරමුල්ල.

යන ලිපිනයට දැන්විය යුතුය. (විදුලි පණිවුඩ සඳහා ලිපිනය "විභාග" පැලවත්ත, බත්තරමුල්ල වේ.)

(අ) විභාගයේ නම :————.

(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.

(ඇ) ලිපිනය :————.

(ඈ) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය :————.

(ඉ) ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය සහ ලියාපදිංචි අංකය :——.

05. විභාගයට පෙනී සිටීම

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු රීති මාලාවක් *ගැසට් නිවේදනයේ* ඇතුළත් කර ඇත.

*සටහන* :- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඩුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ආ) *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම

අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් පමණක් පිළිගනු ඇත.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

එස්. විරිතමුල්ල,
ලේකම්,
තරුණ කටයුතු අමාත්‍යාංශය.

2008 පෙබරවාරි 06 වැනි දින,
කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ,
තරුණ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**තරුණ කටයුතු අමාත්‍යාංශය**
**කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය**

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2007

1st Efficiency bar Examination For Entrepreneurship Development Training Officers - 2007

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :-
සිංහල - 2/දෙමළ - 3

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

01. නම :————.

1.1. මුලකුරු සමග අගට යෙදෙන නම :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

උදාහරණය : SILVA, G. A.

1.2 සම්පූර්ණ නම :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.

(සිංහලෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය :

(ස්ත්‍රී - 1 පුරුෂ 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2. 2.1 රාජකාරී ලිපිනය :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)

2.2 ස්ථිර ලිපිනය :————.

(සිංහලෙන්)

3. විභාගයට පෙනී සිටින විෂයයන්

1. .................................................... එම විෂය අංකය
2. .................................................... එම විෂය අංකය
3. .................................................... එම විෂය අංකය
4. .................................................... එම විෂය අංකය

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන.................................. මයා/මිය/මෙනවිය, මා ඉදිරියේදී අත්සන් තැබූ බව ද ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවද අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවද සහතික කරමි.

————.
අත්සන

දිනය :————.

නම :————.

තනතුර :————.

ලිපිනය :————.

02-565

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**ගාල්ල කාර්මික විද්‍යාලයේ (තාක්ෂණ විද්‍යාලය) ඩිප්ලෝමා මට්ටමේ (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් (NVQ Level) 05 සහ 06) වෘත්තීය පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම- 2008**

ගාල්ල කාර්මික විද්‍යාලයේ (තාක්ෂණ විද්‍යාලය) පැවැත්වෙන, මෙම දැන්වීමෙහි සඳහන් කර ඇති පාඨමාලාව සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමෙහි දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක තම තමන්ගේ අයදුම්පත් අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතුවේ. සෑම අයදුම්පත්‍රයක්ම ආදර්ශ අයදුම්පතෙහි 13 වැනි අංකය යටතේ සඳහන් වන පරිදි වලංගු රු. 10 ක මුද්දරයක් අලවා සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.03.05 දිනට හෝ ඊට පෙර විදුහල්පති, ගාල්ල කාර්මික විද්‍යාලය (තාක්ෂණ විද්‍යාලය), කළුවැල්ල, ගාල්ලට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මෙම පාඨමාලා හැදෑරීමට ඉල්ලුම්කරන ඉල්ලුම්කරුවෙකු/ඉල්ලුම්කාරියක

1. මනා චරිතයකින් යුක්ත විය යුතුය.
2. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
3. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේදී ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

05. සුදුස්සන් තෝරාගනු ලබන්නේ තෝරා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණයක හා/හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

06. ලිපිලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛන ඉදිරිපත් කර, යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

07. සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්ත්වය මත විද්‍යාලයේ පංතිවලට සහභාගී වන සෑම දිනකටම රු. 20ක දීමනාවක්, මසකට රු. 450ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.

පාඨමාලා හදාරන අඩු ආදායම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සීමිත සංඛ්‍යාවකට රු. 2,500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යාධාරයක් ද ගෙවනු ලැබේ.

08. සිය ලිපි ලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. වංචනිකව, වෙනස් කිරීම් සනාථ වනසේ ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වනසේ ලිපිලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියා කරනු ලැබේ.

ආචාර්ය එච්. එල්. ඔබේසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 557,
ඕල්කට් මාවත,
කොළඹ 10.

*ගාල්ල කාර්මික විද්‍යාලයේ (තාක්ෂණ විද්‍යාලය)*
*පැවැත්වෙන පාඨමාලාව පිළිබඳ විස්තර — 2008 වර්ෂය සඳහා*

| *සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *සුදුසුකම් අංකය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* |
|---|---|---|---|
| COT/Mech 5&6 | Mechatronics NVQ Level 05&06<br>පූර්ණ කාල දිවා දෑවුරුදු<br>මාධ්‍ය - ඉංග්‍රීසි | (01) | පහත සඳහන් සුදුසුකම්වලින් අවම වශයෙන් එකක් හෝ සපුරාලිය යුතුය.<br><br>ආයතනික පුහුණුව හෝ පෙර ඉගැනුම් හඳුනාගැනීම් (RPL) මගින් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 03 හෝ ඉහළ මට්ටමක් ලබා තිබිය යුතුයි.<br><br>(i) යාන්ත්‍රණ ශිල්පී (Machinist) හෝ<br>(ii) විදුලි කාර්මික හෝ (Electrician) හෝ |

| සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | සුදුසුකම් අංකය | ඇතුළත්වීමේ සුදුසුකම් |
|---|---|---|---|
| | | | (iii) ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අලුත්වැඩියාකරණය ශිල්පී (Radio, TV & Allied Equipment Repairer)<br>(iv) උපකරණ හා අච්චු සාදන්නා (Tool & Die Maker) හෝ<br>(v) වායව කාර්මික (Pneumatic Technician) හෝ<br>(vi) තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 03 හෝ ඉහළ මට්ටම් ලබා තිබිය යුතුය. (Tea Factory Mechanic NVQ Level 03 or higher) හෝ |
| | | (02) | අවුරුද්දකට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ සේවා පලපුරුද්දක් හෝ පාඨමාලාවක් හදාරා පිළිගත හැකි වෘත්තීය සහතිකයක් ලබා තිබීම. |

| සටහන |
|---|
| අදාළ ඇතුළත්වීමේ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පහත සඳහන් පරීක්ෂණයන් මගින් තෝරාගනු ලැබේ.<br><br>I. තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණය*<br>II. යෝග්‍යතා පරීක්ෂණය<br>හා<br>III. චිත්ත ආකල්පමය හැකියාවන් සඳහා වූ සම්මුඛ පරීක්ෂණයකින් සමත් විය යුතුය.<br><br>* තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේදී ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන ඒකකවලින් සමන්විතය. අයදුම්කරුවන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂය සඳහා සම්මානයක් ද ඉංග්‍රීසි හා විද්‍යාව විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා ඇති අයදුම්කරුවන් මෙම පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. එහෙත්<br><br>යෝග්‍යතා පරීක්ෂණයට හා සම්මුඛ පරීක්ෂණයට සියලුම අපේක්ෂකයන් පෙනී සිටිය යුතුය. |

ආදර්ශ අයදුම්පත්‍රය

ගාල්ල කාර්මික විද්‍යාලය (තාක්ෂණික විද්‍යාලය) ඩිප්ලෝමා මට්ටමේ වෘත්තීය පාඨමාලා
(ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් (NVQ Level) 05සහ 06) සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ
අයදුම්පත - 2008 අධ්‍යයන වසර

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි [ ]

(අයදුම්පත්‍රය, විදුහල්පති, කාර්මික විද්‍යාලය, (තාක්ෂණික විද්‍යාලය), කළුවැල්ල, ගාල්ල වෙතට යැවිය යුතුය.)

01. කාර්මික විද්‍යාලයේ නම :————.

02. පාඨමාලාවේ නම :————.

03. මාධ්‍යය :————.

04. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.

05. මුලකුරුවලින් කියවෙන නම් :————.

06. ස්ථිර ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. දිස්ත්‍රික්කය :————. ඡන්ද කොට්ඨාශය :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාශය :————.

09. උපන් දිනය :————.
2008.01.01 දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

10. ඇතුළත්වීමේ සුදුසුකම් ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ඔබ ලබා ඇති සුදුසුකම් පහත සඳහන් අදාළ කොටුවේ සඳහන් කරන්න. :————.

| ඇතුලත්වීමේ සුදුසුකම් පිළිබඳ විස්තර | | | | | |
|---|---|---|---|---|---|
| සුදුසුකම් අංකය | ලබාඇති සහතික පිළිබඳ විස්තර | NVQ මට්ටම (අදාලවේ නම්) | සහතිකය නිකුත් කල ආයතනයේ නම | අදාල සේවා පලපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර | සේවා කාලය |
| 01 යටතේ<br>02 යටතේ | | | | | අවු. මාස.<br>අවු. මාස. |

11. ඉහත වගුවට අදාල නොවන වෙනත් සහතික සේවා කාලය ආදිය පිළිබඳ අදාල තොරතුරු ඇත්නම් :————.

12. අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල

| විභාග අංකය | වර්ෂය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

13. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මවිසින් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු මම දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම්කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තව ද, කාර්මික විද්‍යාලයට (තාක්ෂණ විද්‍යාලය) සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ පරිපාටියට එකඟවීමට ද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

රු. 10ක මුද්දර අලවා ඒ මත අත්සන තබා අවලංගු කරන්න.

02-661

---

**සංශෝධනයයි**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය 2008 වර්ෂය**

2008, පෙබරවාරි මස 01 වැනි දින අංක 1535 දරන ගැසට් පත්‍රයේ I වැනි කොටස II(ආ) වැනි ඡේදයේ පළ කිරීම් යටතේ ඉහත මාතෘකාවෙන් පළවූ දැන්වීමේ, අංක 06 අයදුම් කරන පිළිවෙල ශීර්ෂයේ අංක 03 ඡේදයේ, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය ලෙස සඳහන් වූ 2008.01.29 දිනය, 2008 මාර්තු මස 05 වැනි දින වශයෙන් සංශෝධනය විය යුතුය.

බී. විජයරත්න,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්.

2008 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ 05,
ඇල්විටිගල මාවත,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව.

02-118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.